**ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ භාරකාර ඔප්පුවේ 11 (ඇ) වගන්තිය විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- අරමුදල සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ බැංකු ගිණුම්වලට කරන ලද සෘජු තැන්පතු හඳුනාගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොමැතිකම තුළ, 2018 සිට 2021 දක්වා වර්ෂ තුළ අරමුදලේ බැංකු ගිණුම් හයක සටහන් කර තිබූ රු.12,699,286 ක සෘජු තැන්පතු හඳුනා ගැනීමට සහ ගිණුම් පොත්වලට අදාළ ගිණුම් සටහන් ඇතුළත් කිරීම් සිදු නොකර හඳුනා නොගත් බැර ලෙස 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ හඳුනාගෙන තිබුණි. | තැන්පතුකරුවන් හඳුනා ගැනීමට අරමුදල පියවර ගන්නා අතර තැන්පත්කරුවන් අවබෝධ කර ගැනීම සඳහා බැංකුවලින් වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ද කටයුතු කරමින් සිටී.<br>දැනටමත් සංකීර්ණ අභ්‍යාසයක් ආරම්භ කර මුළු වටිනාකම රු.මිලියන 12 න් ආසන්න වශයෙන් රු.මිලියන 3 ක් පමණ දැනටමත් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත විය හැකි අතර උත්සාහය දිගටම කරගෙන යනු ලැබේ. | බැංකු ගිණුම් වෙත සෘජුව තැන්පත් කර ඇති මුදල් හඳුනාගෙන ඒවා ප්‍රමාදයකින් තොරව අදාළ ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැයෙන් සියයට 35 ක් නියෝජනය කරන රු.8,181,160 ක් පිරිවැය වූ කාර්යාල උපකරණ සහ වෙනත්, පරිගණක උපාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණ සහ ගෘහභාණ්ඩ උපාංග සහ සවිකිරීම් වැනි සම්පූර්ණ ක්ෂය වූ වත්කම්, දේපල, පිරියත | අරමුදල අයිතමයක ආයු කාලය වර්ෂ පහක් ලෙස සලකන අතර සෑම වර්ෂ පහකට වරක් හෝ අයිතම වැඩි ප්‍රමාණයක් තිබේ නම් නැවත අගය කරනු ලැබේ.<br>අවසාන වාරය 2014 | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කර ඒවා ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූලව ගිණුම්ගත කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| හා උපකරණ - ශ්‍රීලරාඅගිප්‍ර 07 හි 65 ඡේදයේ විධිවිධාන අනුව එම වත්කම්වල ආර්ථික අයුකාලය නැවත තක්සේරු නොකර සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ - ශ්‍රීලරාඅගිප්‍ර 03 හි ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීම සහ මූල්‍ය ප්රකාශනවල නිවැරදි ධාරණ අගය පෙන්වීමේ විධිවිධාන අනුව එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලය නැවත තක්සේරු කිරීමකින් තොරව අරමුදල විසින් අඛණ්ඩව භාවිතා කරනු ලැබේ.<br>එබැවින් එම වත්කම්වල සාධාරණ වටිනාකම සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වී නොතිබුණි. | වර්ෂයේ වූ අතර මීළඟ වාරය 2020 වර්ෂයේ වූ අතර පාරිසරික ගැටළු හේතුවෙන් 2019 වර්ෂය සඳහා එය සිදු කිරීමට නොහැකි විය. එබැවින්, තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත් වූ පසු ක්‍රියාවලිය සිදු කරනු ඇත. | |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂය සඳහා සකස් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉවත දැමිය හැකි සහ විනාශ කරන ලද අයිතමයක් ලෙස රු.448,842 ක මුදලක් වැරදි ලෙස සටහන් කර ඇති බව අරමුදල විසින් විගණනයට වාර්තා කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වනතුරුත් මෙම දෝෂය නිවැරදි කර නොතිබිණි. | එය මුදල් ප්‍රවාහය සකස් කිරීමේදී සිදුවූ මානව දෝෂයකි. නිසැකවම, එය 2022 දී සකස් කරනු ඇත. | ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කළමනාකාරිත්වය අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂය සඳහා පරිගණක උපාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණවල ක්ෂයවීම් වැරදි ලෙස ගණනය කර ඇති අතර 2021 වර්ෂය සඳහා ක්ෂය වීම් රු.223,668 කින් අධි ගණනය වී ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති සමාලෝචිත වර්ෂය සඳහා දේපල, පිරියත හා උපකරණ ලියාහල අගය සහ අතිරික්තය සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉස්මතු කරන ලද දෝෂ සටහන් කරගත් අතර, නිවැරදි කිරීම සඳහා අපි නිසි ලෙස සහභාගි විය. | ගිණුම්කරණ දෝෂ ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමට කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

----------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.81,621,647 ක් වූ බැඳුම්කර සහ ඇපකරවලින් ලැබිය යුතු ආදායමෙන් රු.13,411,839 ක් සහ රු.352,931 ක් පිළිවෙලින් වසර 01 සිට 03 දක්වා සහ වසර 03 කට වැඩි කාලයක් ආපසු අයකර නොගෙන ගිණුම්වල පැවතුනි. | අරමුදලේ ප්‍රතිපත්තියක් ලෙස, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ලබා දෙන සහනදායි ප්‍රතිලාභයේ කොටසක් වන ප්‍රමාද වූ ගෙවීම් පිළිගනී. 2017 වර්ෂයේ සිට සේවා යෝජකයින් කොන්ත්‍රාත්කරුවන් වෙත නීත්‍යානුකූල ගෙවීම් ලබා දීමේදී අඛණ්ඩව පැහැර හැර ඇත. ඒ නිසා අරමුදලට ඒවා අයකර ගැනීමට නොහැක.<br>පවතින තොරතුරු සමඟ 2020, 2021 සහ 2022 දී තත්වය තවත් උග්‍ර වේ. අරමුදල උපකල්පනය කරන්නේ ඒවා නැවත අයකර ගැනීමට තවත් වර්ෂ ගණනාවක් ගතවනු ඇති බවයි. | ප්‍රමාදයකින් තොරව බැඳුම්කර හා ඇපකරවලින් ලැබිය යුතු ආදායමේ ඉතිරි ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ බිල්පත් වට්ටම් ශේෂය රු.10,755,461 කි. ඉන් රු.10,663,441ක් හෙවත් සියයට 99ක් පසුගිය වසර 02 තුළ එක් කොන්ත්‍රාත්කරුවෙකුගෙන් අයකර නොගෙන පැවතුනි. එබැවින් නිසි පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන්ගෙන් මෙම මුදල අයකරගත යුතුය. | යහපත් චේතනාවෙන් යුතුව අරමුදල ආපසු අයකර ගැනීමේ ප්‍රමාදයක් ඇති විය හැකි ව්‍යාපෘති සඳහා මුදල් ගලා ඒම අවම කිරීම සඳහා භාර ගැනීම, සහතික කිරීම සහ අරමුදල් සැපයීම මගින් කොන්ත්‍රාත්කරුවන්ට සහාය වේ.ඉල්ලුම් අනුව බැඳුම්කර සහ ඇපකර ඉල්ලා සිටීමට සේවා යෝජකයන්ටද නිදහස ඇත. මෙම තත්ත්වය යටතේ, සේවා යෝජකයාගේ නිෂේධාත්මක ආකල්පය හේතුවෙන් ව්‍යාපෘති සඳහා බිල්පත් වට්ටම් කිරීමෙන් පසු ප්‍රතිසාධනය කළ හැකි/කළ නොහැකි තත්ත්වයකට අරමුදල බැඳී සිටිය යුතු අවස්ථා ඉල්ලා සිටිය හැක. එවැනි අවස්ථාවන්හිදී කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට ආයතනික නඩු පැවරීම් සහ තත්ත්වයන් සහ රජයේ ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් එම මුදල අයකර ගැනීමට අරමුදලට බලා සිටීමට සිදුවේ. | කොන්ත්‍රාත්කරුගෙන් හිඟ මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2011 සිට 2021 දක්වා කාලයට අදාළව එකතුව රු.88,624,386ක් වූ ඉල්ලුම් ණය ගැතියන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අරමුදලට අයකරගත යුතුව තිබුණද, එයින් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.884,323ක් හෙවත් සියයට 1ක් පමණි. මේ අතර, 2021 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශනවල රු.75,674,224 ක් හෝ මුළු හිඟ ශේෂයෙන් සියයට 85 ක් වූ හානිය සඳහා ප්‍රතිපාදන සලසා ඇත්නම් මිස මෙම ශේෂය අයකර ගැනීමට සහ අයකර ගැනීමේ අවදානම අවම කිරීමට අරමුදල ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2019 වර්ෂය තුළදී රු.4,676,308ක් වූ ඉල්ලුම් ණය ගැතියන් නිසි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව කපා හැර තිබුණි. | පසුගිය දශක දෙක තුළ සේවා යෝජකයින් විසින් ඉල්ලා සිටි ඇපකර කිහිපයක් සඳහා අරමුදල විසින් කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් සේවා යෝජකයන් වෙත ගෙවන ලද මුදල් ආපසු ලබා නොදීම නිසා<br>එහි ප්‍රතිඵලයක් ලෙස එම මුදල් ආපසු අයකර ගැනීම සඳහා බේරුම්කරණයක් පිහිටුවීමට අරමුදල සිදු විය.<br>මෙම ක්‍රියාවලියේදී බොහෝ අවස්ථාවලදී අරමුදලට පක්ෂව නඩු තීන්දුව ලැබෙන අතර කොන්ත්‍රාත්කරුට මුදල් ආපසු නොදෙන බැවින් නඩු තීන්දු තිබියදීත් අරමුදලට තවත් දුරටත් මහාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට සිදුවේ. බොහෝ නඩු විභාග වෙමින් පවතින අතර, ආපසු අයකර ගැනීමට සැලකිය යුතු මුදලක් වැය කර වසර කිහිපයක් ගත විය හැකිය.<br>එබැවින්, ආපසු අයකර ගැනීමේ නිශ්චිත කාලසීමාව අරමුදලට කලින් කීමට නොහැක. | පැහැර හැරීමේ අවදානම අවම කිරීම සඳහා දිගුකාලීන හිඟ ඉල්ලුමක් ඇති ණය ගැතියන් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැඳුම්කර සහ ඇපකරවලින් ලැබිය යුතු ආදායම තුළ එකතුව රු.11,694,080ක් වූ සෘණ ශේෂයන් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල් ලෙස සලකනු ලැබ ඇති අතර මෙම මුදලට පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් හඳුනාගත් එකතුව රු.3,431,981ක සෘණ ශේෂ 11ක් ඇතුළත් වී තිබුණි. එබැවින් මෙම සෘණ ශේෂයන් පියවීම විගණනයේදී සැක සහිත වේ. | 2022 ජනවාරි මාසයේ සිට සැසඳීම් කිරීමට කටයුතු කර ඇති අතර මේ වන විට බොහෝ දෙනා හඳුනාගෙන ඇති අතර ඉතිරි ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාවලියේ පවතී. | සෘණ ශේෂයන් සමථයකට පත් කිරීමට සහ ඉක්මනින් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අගෝස්තු 05 දිනැති අරමුදලේ භාර ඔප්පුව - 9 (එෆ්) වගන්තිය | භාරකාර මණ්ඩලයට වැටුප් දීමනා ලබා ගැනීමට අයිතියක් නොමැති නමුත් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී දරන ලද වියදම් ප්‍රතිපූරණය කළ හැකිය. ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල විසින් රාජකාරි ඉටුකිරීම සඳහා මාසිකව ස්ථාවර මුදලක් ලෙස එකතුව රු.2,500,000ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, භාරකාර මණ්ඩලය විසින් රාජකාරි ඉටු කිරීම සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තර විගණනය සඳහා ලබා දී නොතිබුණි. මෙම සම්බන්ධිත පාර්ශව ගණුදෙණු සම්බන්ධව කිසිඳු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන මගින් සිදු කර නොමැති බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | භාරකාර මණ්ඩලය ඔවුන්ගේ කාර්යාලයේ වගකීම් සහ කාර්ය සාධනය හොඳින් ඇගයීමෙන් පසුව, භාරකාර මණ්ඩලය විසින් වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා පූර්ව තක්සේරු කර ඒකමතිකව අනුමත කරන ලදී.<br>ඒ අනුව මාසිකව සිදුකරන මෙම ගෙවීම සාධාරණීකරණය කළ හැකිය. | අරමුදලේ භාර ඔප්පුවේ විධිවිධානවලට අනුකූලව අරමුදල කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද මූල්‍ය රෙගුලාසි 876 (3). | තවදුරටත් කිසියම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් පවත්වාගෙන යාමට සාධාරණ හේතු තිබේ නම්, එම අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කළ යුතුය. කෙසේ වෙතත්, අරමුදල 2022 මැයි 31 වන විටත් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා බලය පැවරූ අරමුදලක් පිහිටුවා ඇති අතර එහිදී භාණ්ඩාගාර ලේකම් (එස්ටී) බේරුම්කරු ලෙස අවශ්‍ය වූ විට සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | අරමුදල චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

## 1.8 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයේදී ප්‍රතිමිලදී ගැනිමේ ගිවිසුම් සහ ස්ථාවර තැන්පතු ආදියෙහි ආයෝජනය කර ඇති රු.මිලියන 2,333.66 ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන මත අරමුදල රු.මිලියන 149.06 ක ශුද්ධ පොලී ආදායමක් උපයා තිබූ අතර එම ශුද්ධ පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ අතිරික්තයෙන් සියයට 48ක් නියෝජනය කෙරේ. | 2015 - 2019 ඉදිකිරීම් කර්මාන්තයේ පහත වැටීමේ ප්‍රවණතාවක් ඇති විය. කෙසේ වෙතත්, " සෞභාග්‍ය දැක්ම" යටතේ 2020 සහ 2021 වසරවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පිබිදීමක් පුරෝකථනය කර ඇති නමුත් අවාසනාවන්ත ලෙස රජයේ සියලුම සංවර්ධන කටයුතු අරමුදලේ විෂය පථයෙන් ඔබ්බට ගිය මූල්‍ය බාධාවන් හේතුවෙන් පහත වැටී ඇති අතර පවතින තොරතුරු සමඟ නුදුරු අනාගතයේ කිසිදු සංවර්ධන ක්‍රියාවලියක් පුරෝකථනය කළ නොහැක.<br>කෙසේ වෙතත්, අරමුදලේ වගකීම 2024 අවසානය දක්වා ළඟා වන අතර 2024 හෝ 2025 වන විට සංවර්ධනය සමඟ නව යුගයක් බලාපොරොත්තු වේ. | අනෙකුත් ආදායම් වැඩි කරනවාට වඩා මෙහෙයුම් ආදායම වැඩිකර ගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.310,233,611 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.366,657,320 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,423,709ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බැදුම්කර හා ඇපකරවලින් ලැබෙන ආදායම අඩුවීම සහ බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන පිළිවෙලින් රු.16,515,748කින් සහ රු.34,421,934කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කිලෝමීටර් 100,000ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2020 සහ 2021 වසර තුළදී රු.මිලියන 27,730 ක මුදලක් අරමුදලට මුදා හැර තිබුණි. කෙසේ වෙතත්, එයින් රු.මිලියන 630 ක මුදලක් අදාළ කොන්ත්‍රාත්කරුවන් | සේවායෝජකයා විසින් නම් කරන ලද කොන්ත්‍රාත්කරුවන්ට බැදුම්කර සහ ඇපකර ලබාදීමට අරමුදල වාචික එකඟතාවයකට පැමිණි අතර කොන්ත්‍රාත්කරුගේ සියලුම ගෙවීම් අරමුදල හරහා යොමු කිරීමටත් කොන්ත්‍රාත්කරුවන් | මේ සම්බන්ධයෙන් පැහැදිලි කොන්දේසි ඇතුළත් කරමින් මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ ගිවිසුම් හෝ අවබෝධතා ගිවිසුමකට (MoU) |

| | | | |
|---|---|---|---|
| | වෙත මුදා නොහැර 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ රඳවාගෙන තිබුණි. ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දින දක්වා තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් 288 දෙනෙකු සඳහා අරමුදල විසින් අවශ්‍ය බැඳුම්කර සහ ඇපකර ලබා දී ඇති අතර එම කොන්ත්‍රාත්කරුවන් විසින් අවසන් කිරීමට නියමිත මාර්ග වැඩ සංඛ්‍යාව 951 කි. එයින් 2021 දෙසැම්බර් 31 දින වන විට මාර්ග කොන්ත්‍රාත් කටයුතු 149ක් හෝ සියයට 15.6ක් පමණක් අවසන් කර තිබූ අතර අනෙකුත් කොන්ත්‍රාත් කටයුතුවල භෞතික ප්‍රගතිය ඒ දිනය වන විට තිබුණේ සියයට 51ක් පමණි. තවද, ඉහත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය අරමුදලේ සහාය ඇතිව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ ගිවිසුම් හෝ අවබෝධතා ගිවිසුම් (MoU) ඇතිකරගෙන නොතිබුණි. | විසින් සිදු කරන ලද සියලුම කොන්ත්‍රාත්තුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය තහවුරු කර ගැනීමෙන් පසුව නිදහස් කිරීමටත් දෙපාර්ශවයම එකඟ විය.<br>තවද, මෙම අවශ්‍යතාවය සේවා යෝජකයා සමඟ ගිවිසුමක් වන අදාළ බැඳුම්කර සහ ඇපකරවල විශේෂ පදයක් ලෙස ඇතුළත් කර ඇත.<br>කිසිදු තර්කයකින් තොරව ඉල්ලීම් සපුරාලීම සඳහා ලබා දී ඇති කොන්දේසි අනුව ඇපකරු සෑම විටම සේවා යෝජකයාට සෘජුවම බැඳී සිටී. | එළඹිය යුතු අතර ඉල්ලුම් ණය ගැතියන් වැඩි වීමේ අවදානම අවම කිරීම සඳහා නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සහතික කිරීමට අරමුදල අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉහත (අ) හි පෙන්වා දුන් කරුණට අමතරව, 2021 දෙසැම්බර් 31 දිනට වෙනත් කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැරීම සඳහා විවිධ පාර්ශ්වවලින් රු.85,695,106 ක මුදලක් ලැබී ඇති අතර එයින් එකතුව රු.7,162,781 ක් සහ රු.1,776,129 ක් වූ මුදල් පිළිවෙළින් වසර 03 - 05 අතර සහ වසර 05 කට වැඩි කාලයක් අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත නිකුත් කර නොතිබුණි. එබැවින් මෙම මුදල්වල අනාගත පියවීම් සඳහා වන වගකීම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | අවදානම තෘප්තිමත් වන තෙක් සහ අවම කරන තෙක් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් අරමුදලේ රඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා රජය හෝ පරිත්‍යාගශීලීන් යටතේ අරමුදල් සපයන්නේද යන්න නොසලකා සෑම ඉදිකිරීම් ව්‍යාපෘතියක්ම පාහේ කාලය ඉක්මවීම සහ පිරිවැය ඉක්මවා තිබීම හේතුවෙන් සමහර විෂය පථය සම්පූර්ණ නොවී ඒවා වෙත ළඟා නොවීම හේතුවෙන් සේවා යෝජකයාට හෝ කොන්ත්‍රාත්කරුට සාර්ථක ව්‍යාපෘති අනාවැකි පළ කළ නොහැකි බව කර්මාන්තයේ පවතින තත්ත්වය ඔප්පු කර ඇත. මෙම තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ මුදල් එහි අවදානම් සහ වගකීම් අවම වන තෙක් සැලකිය යුතු කාලයක් අරමුදලේ රඳවා ගැනීමට හේතු වී ඇත. | සේවා යෝජකයින්ගෙන් ලැබෙන මුදල් හැකි ඉක්මනින් අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අරමුදල 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සංවර්ධනය කිරිම සඳහා රු.2,984,000 ක වටිනාකමකට ගිවිසුමකට එළැඹ තිබුණි. එම පළමු සහ දෙවන වාරිකයෙන් රු.2,088,800 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 70 ක් ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත ගෙවා තිබුණේ 2015 සහ 2016 වර්ෂවල ය. කෙසේ වෙතත්, මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) 2022 මැයි 31 වන දින දක්වාවත් අවසන් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රවේශමෙන් තක්සේරු කිරීමෙන් පසු අරමුදල විසින් අත්තිකාරම් ලෙස ගෙවා ඇති මුදල් දැනට භාවිතා කරන පැකේජයේ කොටස සඳහා වෙන් කළ හැකි බව සොයාගෙන ඇතත් සම්පූර්ණ පැකේජය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවූ බැවින් සම්පූර්ණ ගෙවීම ඉල්ලා ඇත. භාරකාර මණ්ඩලයට දැනුම් දීමෙන් පසු, අවලංගු කර දැනටමත් ගෙවා ඇති සම්පූර්ණ ගෙවීම ඉල්ලා සිටියේය.<br>ඔවුන්ට ගෙවන ලද මුදලට හිලව් කිරිම සඳහා දැනටමත් සිදු කර ඇති පාවිච්චි කරන කොටස පිළිබඳව අරමුදල තමන්ගේම තක්සේරුවකින් සෑහීමකට පත්වේ. එබැවින්, අරමුදලට පාඩුවක් නැත, නමුත් සම්පූර්ණ ව්‍යාපෘතිය ලිහිල් වන බැවින් සම්පූර්ණ ගෙවීමක් ඉල්ලා සිටියේය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | අරමුදලේ ආයතනික අරමුණු අනුව සංවිධානය තුළ පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් (QuickBooks හෝ QB) සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, QB මිලදී ගැනීම සඳහා රු.160,000 ක මුදලක් වැය වුවද, පසුගිය වසර තුන තුළ අරමුදලට මෙම අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අරමුදල තවමත් එහි සම්පූර්ණ ගනුදෙනු අතින් සහ එක්සෙල් පත්‍රවල සටහන් කර තිබුණි. එබැවින් QB මිලදී ගැනීම සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි. | තොරතුරු තාක්ෂණ විසඳුමක් සඳහා සපයන්නා අසමත් වීමෙන් පසු, කාර්යයේ පරිමාව සැලකිල්ලට ගනිමින්, අතින් වැඩ කටයුතු දිගු කිරීම සඳහා, අඛණ්ඩව යාවත්කාලීන කළ යුතු සහ දිගටම කරගෙන යාමට අර්ධ ස්වයංක්‍රීය සූදානම් කළ පැකේජයක් මිලදී ගන්නා ලදී. නමුත් 2020 සහ 2021 කාලය තුළ කාර්ය මණ්ඩලයේ විස්ථාපනය හේතුවෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි විය. | වියදම් කරන මුදලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට අරමුදල කටයුතු කළ යුතුය. |
| (ඉ) | අරමුදල 1999 දී ආරම්භ කරන ලද අතර 2000 සිට 2005 දක්වා කාලය තුළ අවස්ථා හතරකදී මහා භාණ්ඩාගාරයෙන් රු.55,000,000 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලැබිණි. එබැවින් සෑම වසරකම මුළු ශුද්ධ ලාභය හෝ | ප්‍රධානය සහ ඉතුරුම් සේවාව සැපයීම සඳහා සීමාව ඉහළ නැංවීමට භාවිතා කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස අතේ අතිරික්ත අරමුදල් නොමැත.<br>එහි ආරම්භයේ සිට සංවිධානය | අරමුදල සම්පූර්ණයෙන්ම රාජ්‍ය ආයතනයක් වන බැවින්, අරමුදල විසින් උපයන ලද අතිරික්තය හෝ |

| | | |
|---|---|---|
| අරමුදල උපයන ලාභයෙන් කොටසක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ රඳවාගෙන සිටි රු.602,518,233 ක රඳවා ගත් ලාභයක් වුවද, අරමුදල ආරම්භයේ සිටම මහා භාණ්ඩාගාරයට ශතයක්වත් ප්‍රේෂණය කර නොතිබුණි. තවද, 2021 ජනවාරි 01 දිනට රඳවා ගත් ඉපැයීම්වලින් රු.500,000,000 ක මුදලක් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ "යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන" නම් ගිණුමකට මාරු කර තිබුණි. | සීමිත ඉඩක් කුලියට ගත් බැවින් සහ තමන්ගේම ලේකම් කාර්යාලයක් පිහිටුවීමට පසුගිය කාලයේ උත්සාහයන් කිහිපයක් ගත් අතර ඒ සඳහා භාරකාර මණ්ඩලයේ එකඟතාවය ඇතිව ප්‍රතිපාදන වෙන් කරන ලදී. | අතිරික්තයේ කොටස වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුළදී අරමුදල විසින් රු.6,061,011ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම ලබාගෙන තිබුණද, 2006 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2 සහ 4.2.2 මාර්ගෝපදේශයන්ට අනුව 2021 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් අරමුදල විසින් සකස් කර නොතිබුණි. | අරමුදලට දැනටමත් 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාලසටහනක් තිබෙන අතර විගණකවරුන්ගේ ඉල්ලීම මත විගණන කාර්යය සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූලව අරමුදල විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කළ යුතුය. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද රු.878,321 ක් වටිනා ප්‍රසම්පාදන සඳහා අවස්ථා 11 කදී අරමුදල අවම මිල ගණන් තුනක් ලබාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආයතනය සඳහා මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසිදායක සහ ගුණාත්මකව හොඳම සේවා සහ සැපයුම්කරුවන් ලබා ගැනීමේ අවස්ථාව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වි තිබුණි. | අරමුදල බොහෝ විට ලියාපදිංචි/තෝරාගත් සැපයුම්කරුවන් අතර මිල ගණන් බෙදා හැරියද, ඔවුන් කිසිවෙක් සාධාරණ වලංගු කාල සීමාවක් සහ මිල විශාල ලෙස වෙනස් වන මිල ගණන් ලබා දීමට නැඹුරු නොවේ. | අරමුදල ප්‍රසම්පාදන අත්පොතෙහි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 මගින් නිකුත් කරන ලද 877 (2) (ඉ) මූල්‍ය රෙගුලාසියට අනුව, අරමුදලේ ගිණුම්කරණ නිලධාරියා විසින් නියමිත විධිවිධාන යටතේ භාෂා තුනෙන්ම වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කළ යුතු අතර එක් එක් මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත ඉහත වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, මෙම විගණන වාර්තාව නිකුත් කරන දිනය දක්වාවත් අරමුදල විසින් 2020 සහ 2021 වසර සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සියලුම වාර්ෂික වාර්තා කාර්ය සාධන ප්‍රගතිය සමඟ ඇතුළත් කර 2000 වර්ෂයේ සිට සකස් කර ඇත, පිටපත් නිතිපතා බෙරුම්කරු වෙත යවන ලද අතර අනෙකුත් භාෂා දෙකට පරිවර්තනය කිරීමට පියවර ගෙන ඇති අතර ඒවා පහසුවෙන් ලබාගත හැකිය. අරමුදලට ඍජුවම පාර්ලිමේන්තුවට ප්‍රවේශයක් නැත, එබැවින් ඩීජී (රාජ්‍ය) මූල්‍ය සහ පදිංචිකරු, භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යාංශය හරහා සියලුම ලියකියවිලි අදාළ අධිකාරීන්/ ආයතන වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා යොමු කෙරේ. | වාර්ෂික කාර්ය සාධන වාර්තා චක්‍රලේඛයෙන් දක්වා ඇති උපදෙස් අනුව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියට අනුව, ආරක්ෂණ අරමුදල මගින් සිදුකරන සියලුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට යටත් කළ යුතු වුවද, සංවිධානය තුළ අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කිරීම සඳහා අරමුදල විසින් සුදුසුකම් ලත් විගණකවරයෙකු පත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කමිටුව කාර්ය මණ්ඩලයේ නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් සමන්විත වන අතර අභ්‍යන්තර විගණනය අඛණ්ඩව සිදු කරයි. අඩුපාඩු හඳුනාගත් විට ඒවා වහා නිවැරදි කළ නමුත් කිසිදු වාර්තාවක් පවත්වාගෙන යනු නොලැබේ. අවාසනාවන්ත ක්ෂණික හැසිරීම හේතුවෙන් ලෙස 2020 මැද භාගයේ සිට ක්‍රියාවලිය නිතිපතා කරගෙන යාමට නොහැකි වූ අතර තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පැමිණි පසු ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටී. | අරමුදල විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට ලක් කළ යුතුය. |

**4.3 අයවැය පාලනය**

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද 877 (1) (ඇ) මූල්‍ය රෙගුලාසියට අනුව, ඉදිරි වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය එහි අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් 30 වන දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වෙතත්, 2021 වර්ෂය සඳහා වන අරමුදලේ අයවැය ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන 2022 ජනවාරි 21 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂය සඳහා වන අයවැය සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලය විසින් 2020 ජුනි මාසයේදී අනුමත කරන ලද අතර ඉල්ලීම මත 2022 ජනවාරි 21 වන දින විගණකවරුන් වෙත ඉදිරිපත් කරන ලදී. | අයවැය චක්‍රලේඛයේ නියමිත ආකෘතියෙන් සකස් කළ යුතු අතර, එහි අනුමැතිය ලබා ගැනීම සඳහා එය ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් 30 වැනි දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. |